පොලිස් මූලස්ථානය, කොළඹ, ශ්‍රී ලංකාව
பொலிஸ் தலைமையகம், கொழும்பு, இலங்கை
POLICE HEAD QUARTERS, COLOMBO, SRI LANKA

තැ. පෙ. අංකය / த. பெ .இல. / P. O. Box No. 517
ෆැක්ස් / தொலைநகல் / Fax No. 011- 2329500
දුරකථනය / தொலைபேசி / Telephone 011-2384024 011-2395605
ඊ - මේල් / மின்-அஞ்சல் / E-Mail Policemedia@police.lk
Website: www.police.lk

මගේ අංකය / எனது இல. / My No. PMD / PR / 939 / 21
ඔබේ අංකය / உமது இல. / Your No.
දිනය / திகதி / Date 2021.07.29 පැය 1040

**මාධ්‍ය නිවේදනය**

**ප්‍රධාන කර්තෘ / ප්‍රවෘත්ති කර්තෘ,**
**අධ්‍යක්ෂ ප්‍රවෘත්ති / ප්‍රවෘත්ති කළමණාකරු,**
**සියළුම මාධ්‍ය ආයතන.**

## POLISH, RABUKKANA යනුවෙන් සදහන් කර ධාවනය වන නිල් පැහැති ජීප් රථයක් පිළිබඳව සමාජ මාධ්‍ය ජාලා වල සංසරණය වීම.

ශ්‍රී ලංකා පොලිසියට නිකුත් කර ඇති ටාටා සුමෝ වර්ගයේ නිල් පැහැති ජීප් රථයක දකුණු පස දොරේ POLISH, RABUKKANA යනුවෙන් සදහන් කර පොලිස් ජීප් රථයක් ලෙසට මහජනතාවට අවබෝධ වන පරිදි මාර්ගයේ ධාවනය කරමින් සිටින අවස්ථාවක් පෙන්නුම් කරන ඡායාරූපයක් සාමාජ මාධ්‍ය ජාලාවල මේ දිනවල සංසරණය වේ.

**මෙම ජීප් රථය රඹුක්කන පොලිස් ස්ථානයට හෝ ශ්‍රී ලංකා පොලිසියට අයත් ජීප් රථයක් නොවන** අතර වාරියපොල ප්‍රදේශයේ වාහන අලෙවි කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යන පුද්ගලයකු විසින් ඔහුට අයත් ජීප් රථයක් මෙසේ මහජනතාව මුලා කිරීම සඳහා POLISH, RABUKKANA යනුවෙන් සදහන් කර ධාවනය කිරීම නිසා එම ජීප් රථය සහ සැකකරු 2021.04.10 වන දින රඹුක්කන පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් වාරියපොල දී අත්අඩංගුවට ගෙන වාරියපොල පොලිස් ස්ථානයට ඉදිරිපත් කර ඇත.

ඒ අනුව වාරියපොල පොලිස් ස්ථානය මගින් සැකකරු 2021.04.11 වන දින වාරියපොල ගරු මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කර රැඳවුම් නියෝග ලබාගෙන විමර්ශණ පවත්වා 2021.04.13 වන දින නැවත වාරියපොල ගරු මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කිරීමෙන් පසු දැනට ඇප මත මුදා හැර ඇත. මෙම සැකකරු පිළිබඳ ඉදිරි විමර්ශන වාරියපොල පොලිසිය මගින් සිදු කරගෙන යනු ලබයි.

මේ අනුව පෙනී යන්නේ දැනට මාස තුනකට පමණ පෙර සිදුවූ සිදුවීමක ඡායා රූපයක් මේ දින වල සමාජ මාධ්‍ය ජාලාවල පල කර ඇති බවයි. මේ තුලින් මහජනතාව වැරදි අවබෝධයක් ඇති කරගන්නා බැවින් එය නිවැරදි කිරීම සඳහා මෙම මාධ්‍ය නිවේදනය ඔබවෙත යොමු කරමි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය,**
**පොලිස් මූලස්ථානය.**